**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

# පරීක්ෂක වාර්තාව

## අන්තර්මධ්‍ය විභාගය - ජනවාරි 2015

## (55) තොරතුරු කළමනාකරණය හා ව්‍යාපාරික භාවිතය
(Information Management & Application in Business)

---

සිසුන්ගේ ප්‍රායෝගික දැනුම ඉලක්ක කර සාදන ලද ප්‍රශ්න පත්‍රයක් ලෙස මෙවර ප්‍රශ්න පත්‍රය දැක්විය හැක. බොහෝ සිසුන් තමාගේ තාක්ෂණික දැනුම ප්‍රායෝගික මට්ටමින් වැඩි දියුණු කර ගන්නා වකවානුවක මෙවන් ප්‍රශ්න පත්‍රයක් තුලින් සිසුන්ගේ දැනුම පරීක්ෂා කිරීම ඉතාමත් කාලෝචිතය.

## A - කොටස
**බහුවරණ ප්‍රශ්න**

**ප්‍රශ්න අංක 01 - ලකුණු 40**
**(අනිවාර්ය ප්‍රශ්නයකි.)**

කොටස් 20 කින් සමන්විත වූ බහුවරණ ප්‍රශ්න සහිත මෙම ප්‍රශ්නය ඉතාමත් ප්‍රායෝගික වූ ප්‍රශ්නවලින් සමන්විතව සාදා තිබුණි. තොරතුරු තාක්ෂණය හා ව්‍යාපාරික භාවිතය එක් ව ඇතිවන ගැටළු හා සම්බන්ධව දැනුම පිරික්සා තිබුණි. ළමුන් ඉතා විශාල ප්‍රමාණයක් ලකුණු 30 ට අඩු ප්‍රමාණයක සිටී. සමස්ථ ප්‍රශ්න පත්‍රය සමත් වීමට පළමුවෙනි ප්‍රශ්නයෙන් ලබා ගන්නා ලකුණු ඉතා වැදගත් වේ.

## B - කොටස

**ප්‍රශ්න අංක 02 - ලකුණු 15**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි.)**

මෙය ප්‍රශ්න අංක 02 සිට 07 දක්වා තෝරා ගත හැකි ප්‍රශ්න 06 න් එකකි. (a), (b), (c) හා (d) ලෙස මෙම ප්‍රශ්නය කොටස් 4 කින් යුක්තය. සමස්ථයක් ලෙස සැළකීමේ දී මෙම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු ලියූ බොහෝ සිසුන් මෙම ප්‍රශ්නයට ඉතාමත් හොඳින් පිළිතුරු සපයා ලකුණු 15 ම හෝ 10-15 කට ආසන්න ලකුණු ලබා තිබුණි. ඉතාමත් සාර්ථක ප්‍රශ්නයක් ලෙස මෙම ප්‍රශ්නය පිළිබඳ හැඳින්විය හැකිය.

(a) මෙම කොටසින් අසා ඇත්තේ දත්ත සහ තොරතුරු අතර වෙනසය. ඉතා හොඳින් පිළිතුරු සපයා තිබුණි.

(b) මෙම කොටසින් තොරතුරු පද්ධතිය හා එහි කාර්යයන් ගැන විමසා තිබුණි. ඉතාමත් සාර්ථකව ඊට ද පිළිතුරු සපයා ලකුණු ලබාගෙන තිබුණි.

(c) සංවිධානයක ප්‍රශ්න විසඳීමේ ක්‍රියාවලිය වෙනුවෙන් තීරණ ගැනීම සඳහා සුදුසු තොරතුරුවල ලක්ෂණ විමසා තිබුණු මෙම කොටසට ද ඉතා සාර්ථකව පිළිතුරු සපයා තිබුණි.

(d) බැංකුවක් අයදුම්කරුවෙකුගේ ණයමුදලක් අනුමත කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් සිසුන්ගේ දැනුම විමසා බලන මෙම කොටසට පිළිතුරු සැපයීමේදී සමහර සිසුන් යම් අසාර්ථක බවක් පෙන්නුම් කර ඇත. මෙයට හේතුව වනුයේ තොරතුරු තාක්ෂණික හා කළමනාකරණ සිද්ධාන්ත ප්‍රායෝගිකව යොදාගැනීමට සිසුන් දක්වන දුර්වලතාවයයි.

**ප්‍රශ්න අංක 03 - ලකුණු 15**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි.)**

ආයතනයක තොරතුරු පද්ධති පිළිබඳ දළ අවබෝධය සහ ඒවා හඳුනා ගැනීම මෙම ප්‍රශ්නයෙන් විමසා තිබුණි. ඒ යටතේ කොටස් 3 කි. එනම්, නිෂ්පාදන තොරතුරු පද්ධතියක ඉටු කරන කාර්යයන්, ව්‍යාපාර සම්පත් සැලසුම් පද්ධතිය හා කළමනාකරණ තොරතුරු පද්ධතිය සහ ගනුදෙනු සැකසුම් පද්ධතිය සම්බන්ධව සිසුන්ගේ දැනුම පිරික්සා බලන ප්‍රශ්නයකි. වැඩි සිසුන් පිරිසක් පළමු සහ දෙවන කොටස් සඳහා සාර්ථකව පිළිතුරු ඉදිරිපත් කිරීම කෙරෙහි යොමු වී ඇත.

(a) මෙම කොටස සඳහා පිළිතුරු සැපයීමේදී වඩාත් සාර්ථකව පිළිතුරු සැපයීමට සිසුන් සමත්ව ඇති බව නිරීක්ෂණය විය.

(b) මෙම කොටසටද සිසුන්ට ලකුණු ලබා ගැනීමට හැකියාවක් තිබුණි. ඉතා හොඳින් රූප සටහන් භාවිතා කර අදාළ පිළිතුරු සැපයීමට සැළකිය යුතු සිසුන් පිරිසක් සමත් ව තිබුණි.

(c) මෙම කොටස සඳහා පිළිතුරු සැපයීමේදී ප්‍රශ්නය නිවැරදිව අවබෝධ කර නොගැනීම නිසා අපේක්ෂිත ලකුණු ලබා ගැනීමට සිසුන්ට හැකියාව නොමැති වී ඇති බව නිරීක්ෂණය විය.

"සංවිධානයක, කළමනාකරණ තොරතුරු පද්ධතියක්, ගනුදෙනු සැකසුම් පද්ධති (Transaction processing Systems -TPS) වැනි වෙනත් තොරතුරු පද්ධති සඳහා දත්ත ප්‍රභවයක් වේ" යන ප්‍රකාශය සඳහා එකඟවිය හැකිද නැද්ද යන්න පැහැදිලිව දක්වා පිළිතුර සාධාරණීකරණය කළ යුතුය. වඩාත් සරල ලෙස කරුණු දැක්වීම සහ නිවැරදි උදාහරණ ඒ සඳහා භාවිත කළ හැක.

**ප්‍රශ්න අංක 04 - ලකුණු 15**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි.)**

මෙය නවීන පරිගණක ක්‍රියාකාරීත්වය සම්බන්ධ දැනුම පරීක්ෂා කරනු ලබන කාලීන ප්‍රශ්නයකි. මෙයට බොහෝ දෙනෙක් පිළිතුරු ලිවීමට උත්සාහ දරා ඇත. නමුත් සිසුන්ට පිළිතුරු සාර්ථක මට්ටමින් සැපයීමට හැකියාවක් ලැබී නැත. නමුත් මෙම ප්‍රශ්නය පහසුවෙන් ලකුණු ලබා ගැනීමට හැකියාවක් තිබුණු ප්‍රශ්නයකි.

(a) මෙම කොටසින් විමසා තිබුණේ නවීන පරිගණකවල “කෝර්” සම්බන්ධවයි. මෙයට පිළිතුරු සැපයූ සිසුන්ගෙන් බෙහොමයක් සාර්ථකව පිළිතුරු සැපයීමට හැකියාවක් නොතිබිණි. මන්ද යත් ඔවුන් පෙන්ටියම් හා සම්බන්ධ කර පිළිතුරු සැපයීමට උත්සාහ දරා තිබීමයි. එමගින් උදාහරණ 2 ක් ලෙස දැක්වීමට ඇති සංකේතමය අගයන් වරද්දා ගෙන ඇත.

(b) මෙම කොටසට සිසුන් බෙහොමයක් සාර්ථකව පිළිතුරු සපයා තිබිණ. නමුත් මෙහිදී අතලොස්සක් දෙනා OCR හා OMR කෙටි යෙදුම්වල තේරුම හරිහැටි අර්ථ කථනය කර නොමැත.

(c) මෙම කොටස පහසුවෙන් පිළිතුරු සැපයිය හැකි කොටසකි. මෙයට සිසුන් සාර්ථකව පිළිතුරු සපයා ඇත. මෙහිදී බොහෝ දෙනා සමාන අසමානකම් වෙන් වෙන් ව වර්ග කර දක්වා නොමැති බව දැකිය හැකි වුණි.

(d) ඉහත ප්‍රශ්නවලට සම්බන්ධතාවක් නොතිබුණු මෙම කොටසින් විමසා ඇත්තේ ගිණුම්කරණ පැකේජ සම්බන්ධවය. මෙයට පිළිතුරු සැපයූ සිසුන්ගෙන් 75% ක් පමණ සාර්ථකව පිළිතුරු සපයා ඇත. නමුත් සමහර සිසුන් ගිණුම්කරණ මෘදුකාංග පැකේජ වෙනුවට පරිගණක පද්ධති ගැන සිතා Microsoft Office පිළිබඳව සඳහන් කර ලකුණු අහිමි කරගෙන තිබුණි.

**ප්‍රශ්න අංක 05 - ලකුණු 15**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි.)**

මෙම ප්‍රශ්නය තෝරාගෙන තිබුණ සිසුන් සංඛ්‍යාව සාපේක්ෂව අඩුය. එමෙන්ම මෙම ප්‍රශ්නයට උත්සහා කර ඇති සිසුන් අතරින් ඉතා විශාල ප්‍රමාණයක පිළිතුරු ඉතා දුර්වල මට්ටමක විය.

තොරතුරු පද්ධති සංවර්ධනය පිළිබඳ සිසුන්ගේ දැනුම විමසා බලන මෙම ප්‍රශ්නය කොටස් 02 කින් සමන්විත වේ.

(a) මෙම කොටසින් විමසා තිබුණේ තොරතුරු පද්ධති සංවර්ධන ව්‍යාපෘතියක් අවලංගු කිරීම කෙරෙහි දායක වන කරුණු මොනවාද යන්නය. සිසුන්ගෙන් ඉතා විශාල ප්‍රමාණයක් වැරදි පිළිතුරු සපයා තිබුණි. නිවැරදි පිළිතුරු සැපයීමට සමත්ව තිබුණේ ඉතා සුළු පිරිසක් පමණි.

(b) තොරතුරු පද්ධති සංවර්ධන ජීවන චක්‍රයේ සංරචකයක් වන පද්ධති පරීක්ෂාව පිළිබඳ ව විමසා තිබූ මෙම කොටසට ද සාර්ථක ලෙස පිළිතුරු සැපයීමට සිසුන් අපොහොසත් විය. පළමු කොටසට සාපේක්ෂව යම් ලකුණු ප්‍රමාණයක් ලබා ගැනීමට සිසුන්ට හැකියාව තිබුණ ද ප්‍රමාණවත් තරම් ලකුණු ලබා ගැනීමට ඔවුන් අපොහොසත් විය.

**ප්‍රශ්න අංක 06 - ලකුණු 15**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි.)**

මෙය සිසුන්ගේ අන්තර්ජාල සම්බන්ධ දැනුම පරීක්ෂා කෙරෙන ප්‍රශ්නයක් ලෙස හැඳින්විය හැකිය. සිසුන්ට වඩාත් හොඳින් ලකුණු ලබා ගැනීමට හැකියාවක් තිබුණු ප්‍රායෝගික ප්‍රශ්නයකි.

(a) විද්‍යුත් තැපැල භාවිතා කිරීමේ වාසි විමසා බලන මෙම කොටසට සිසුන් ඉතාමත් සාර්ථක ලෙස පිළිතුරු සපයා තිබුණි. එමගින් ලකුණු 4 ම ලබාගත් සිසුන් ප්‍රමාණය ඉතා වැඩිය.

(b) විද්‍යුත් වාණිජ්‍යය වර්ගීකරණය සඳහා වූ ආකෘති සම්බන්ධව විමසා තිබුණු මෙම කොටසට පොතපත පරිශීලනය කරන්නේනම් ඉතාමත් හොඳින් පිළිතරු සැපයීමට හැකිය.

(c) ජංගම වාණිජ්‍යය සම්බන්ධව විමසා තිබුණු මෙම කොටසින් ද සිසුන්ට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගැනීමට හැකියාවක් තිබුණි. මන්ද අන්තර්ජාලය සම්බන්ධව හා නවීන තාක්ෂණය සම්බන්ධන සිසුන්ගේ පවතින වැඩි නැඹුරුතාවය හා වැඩි දැනුම මගින් මෙවන් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම වඩාත් පහසු වී තිබේ.

**ප්‍රශ්න අංක 07 - ලකුණු 15**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි.)**

මෙම ප්‍රශ්නයෙන් සිසුන්ගේ නිදහස් මෘදුකාංග සහ හුවමාරු මෘදුකාංග පිළිබඳ දැනුම, තොරුතුරු පද්ධති තුළ ක්‍රියාත්මක කළ හැකි ප්‍රතිදාන පාලන පිළිබඳව, සොරකම හඳුනා ගැනීමට යොදා ගත හැකි නවීන උපකරණ පිළිබඳව සහ ආපදා ප්‍රතිදාන සැලසුම් පිළිබඳව දැනුම පිරික්සා බලන ලදී. ඉතාමත් කාලෝචිත ප්‍රශ්නයක් වුවද සිසුන් බොහෝ ප්‍රමාණයක් මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට තෝරාගෙන නොතිබුණි. පිළිතුරු සපයා තිබුණු සිසුන් වුවද වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගැනීමට අපොහොසත් විය. විෂය පද්ධතිය පිළිබඳව සිසුන් හරි හැටි අවබෝධය කරගෙන නොමැති බව පෙනී යයි.

(a) මෙම කොටස සඳහා, ප්‍රශ්නය තෝරාගත් සෑම සිසුවෙකුම සාර්ථකව පිළිතුරු සපයා තිබුණි.

(b) මෙම කොටස සඳහා පිළිතුරු ලබා දී තිබුණද බොහෝ සිසුන් වැරදි පිළිතුරු සපයා තිබුණි. මෙම කොටසට පිළිතුරු සැපයීම සම්බන්ධයෙන් සෑහීමකට පත්විය නොහැකිය. මෙහිදී සිසුන් ප්‍රශ්නය හරිහැටි තේරුම් ගෙන නොමැති බවක් පෙනීයයි. මෙය ඉතා පහසු පැනයකි. ප්‍රතිපාදන පාලන සම්බන්ධව සිසුන්ගේ දැනුම අල්ප බව පෙනී යයි. පොත පරිශීලනය කිරීම ද අඩු මට්ටමක පවතින බව පෙනේ. පසුගිය ප්‍රශ්න පත්‍ර හොඳින් අධ්‍යයනය කරන සිසුන්ට මෙවැනි ප්‍රශ්න වලට පිළිතුරු ලිවීම එතරම් අපහසු නොවේ.

(c) මෙම කොටසටද සිසුන් පිළිතුරු සපයා තිබුණ ද බොහෝ පිළිතුරු වලින් එක් පිළිතුරක් පමණක් නිවැරදිය.

(d) මෙම කොටසටද සිසුන් පිළිතරු සපයා තිබුණ නමුත් දී ඇති බොහෝ පිළිතරු සම්පූර්ණ ලකුණු ලබා ගැනීමට තරම් ප්‍රමාණවත් නොවිය.

**විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනීම සඳහා සැලකිල්ල යොමු කළ යුතු පොදු කරුණු:**

1. පිළිතුරු සැපයීමට පෙර ප්‍රශ්නය හොඳින් කියවා නිවැරදිව වටහාගෙන අසා ඇති දෙයට පමණක් පිළිතුරු සැපයිය යුතුය.

2. සිසුන්ට එක් එක් ක්ෂේත්‍රවල තාක්ෂණික වචන පිළිබඳව හා ඒවායේ වෙනස්කම් පිළිබඳ මනා වැටහීමක් තිබිය යුතුය.

3. තොරතුරු තාක්ෂණය සම්බන්ධ ගැටළු වලට පිළිතුරු ලිවීමේදී අළුතින් නිකුත් කරන සඟරා, පුවත්පත්, අත්පොත්, පාඨ ග්‍රන්ථ හා අන්තර්ජාලය හොඳින් පරිශීලනය කර නිරන්තරයෙන් අධ්‍යයනය කළ යුතු වේ

4. විශේෂයෙන් තොරතුරු තාක්ෂණයේ නව ප්‍රවණතා සම්බන්ධව දැනුම යාවත්කාලීන කර ගැනීම.

5. තොරතුරු තාක්ෂණයේ න්‍යායාත්මක කරුණු ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරන ආකාරය පැහැදිලිව දැන සිටීම.

6. විශේෂයෙන්ම, බහුවරණ කොටස සඳහා පිළිතුරු සැපයීමේදී නිවැරදි ප්‍රශ්න අංක (ඉංග්‍රීසි අක්ෂරයන්) පිළිවෙලින් උත්තර පොතේ සඳහන් කර එම ප්‍රශ්න වල උත්තරයන්ට අදාල ඉලක්කම පැහැදිලිව දැක්විය යුතුය (අනුපිළිවෙලට A සිට T දක්වා ප්‍රශ්න අංක යෙදීම).

7. අළුත් ප්‍රශ්නයක් අළුත් පිටුවකින් ආරම්භ කළ යුතුය.

8. අත් අකුරු පැහැදිලිව ලිවිය යුතුය.

9. උත්තර පත්‍ර භාර දීමට පෙර විභාග ශාලාවේදී ප්‍රශ්න අංක හා තමන්ගේ විභාග අංකය නිසිපරිදි යොදා ඇත්දැයි පරික්ෂා කර බැලීම.

10. විභාගයට පෙර සූදානමක් සහිතව පසුගිය ප්‍රශ්නපත්‍ර පරිශීලනය කිරීම හා ඒඒටී ආයතනය නිකුත් කර ඇති ස්වඅධ්‍යයන පාඩම්මාලා පොත (Study Pack) හොඳින් අධ්‍යයනය කිරීම.

- * * * -